## ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ චුල්ලවග්ගපාළියේ හා සමන්තපාසාදිකාවේ අන්තර්ගතය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ප්‍රථම ධර්ම සංගීතිය පවත්වන ලදි. ඒ පිළිබඳ ව හමුවන මූලාශ්‍ර අතරින් පැරණි ම මූලාශ්‍රය චුලලවග්ග පාළියේ පඤ්චසතිකක්ඛන්ධකයයි. පසුකාලීනව මෙකී වාර්තාව ඉදිරිපත් කරන්නේ බුද්ධඝෝෂ මාහිමියන් විසින් රචිත සමන්තපාසාදිකාවේය. මේ දෙකෙහි එන වාර්තා තුලනාත්මකව අධ්‍යයනය කිරීමේදී යම් යම් වෙනස්කම් දැකිය හැකිය. ඒ අනුව එකම සම්ප්‍රදායක් වූ ථේරවාද සම්ප්‍රදාය විසින් ඉදිරිපත් කෙරෙන ග්‍රන්ථ දෙකක එන වාර්තාව දෙ ආකාරයකින් ඉදිරිපත් කර තිබීම පරස්පර අදහස් ඉදිරිපත් කිරීමකි. මෙම ග්‍රන්ථ දෙක අතරින් චුල්ලවග්ග පාළිය ත්‍රිපිටකාගත කෘතියකි. ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ තොරතුරු මෙහි අන්තර්ගත වන බැවින් මෙය බුද්ධ පරිනිර්වාණයෙන් පසුව එකතු කරන ලද කොටසක් ලෙස හඳුන්වා දිය හැකිය. එනම් සංගීතිකාරක තෙරවරුන් ම මෙහි කතුවරුන්ය. මෙම ඛන්ධකය ආරම්භ වන්නේ මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ පන්සියයක් භික්ෂූන් සමග පාවා නුවර සිට කුසිනාරා නුවර දක්වා වඩින අවස්ථාවේ අතරමැද හමු වූ ආජීවකයා සමග කළ සංවාදයෙනි. එහි දී උන්වහන්සේ බුදුරජුන් පිරිනිවන් පෑ බව දැනගනී. මේ බව දැනගත් ඇතැම් අවීතරාගී වූ භික්ෂූහු බුදුරජාණන් වහන්සේ ඉතා ඉක්මණින් පිරිනිවන් පෑවේ යැයි කියා හිසෙහි අත් බැදගෙන, සිඳින ලද්දක් වැටෙන්නා සේ ඉදිරියට පසුපසට පෙරළෙති. වීතරාගී වූ භික්ෂූහු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාව මෙනෙහි කළහ. ඉක්බිති මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ භික්ෂූන් අමතා මහණෙනි, ශෝක නොකරන්න. නොවැලපෙන්න. මේ ලෝකයේ යම් සංඛත වූ දෙයක් හටගත්තේ නම් ඒ සියල්ල විනාශ වන බව බුදුරජුන් පවා පෙන්වා දී ඇත. මේ අවස්ථාවේ පිරිස අතර සිටි බුඩ්ඪ පබ්බජිත වූ සුභද්‍ර නම් භික්ෂුව ''ඇවැත්නි, කම් නැත. ශෝක නොකරවු, නොවැලපෙවු, අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මොනවට මිදුණෝ වෙමු. මෙය තොපට කැපය, මෙය තොපට අකරපය, කීමෙන් උපද්‍රවයට ද පත්කරන ලද්දෝ වෙමු. දැන් අපි යමක් කැමති නම් එය කරන්නෙමු. යමක් අකමැතිනම් එය නොකරන්නෙමු.''[1]

මෙකී ප්‍රකාශය මේ ආකාරයෙන් ම මහාපරිනිබ්බාන සූත්‍රයේ ද දක්නට ලැබේ.[2] සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ ද මෙම ප්‍රකාශය සමානව ම දක්වා තිබේ.[3] සුභද්‍ර භික්ෂුව විසින් කරන ලද මෙම ප්‍රකාශය බරපතල වූවකි. ඒ අනුව මහා පරිනිර්වාණයෙන් පසුව සිදු වූ සුභද්‍රගේ අභද්‍ර පකාශය කිසිදු වෙනස්කමකින් තොරව විස්තර කර ඇති අයුරු දැක ගත හැකිය. චුල්ලවග්ග පාළියේ දැක්වෙන විස්තරයට අනුව මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ මෙකී ප්‍රකාශය ඇසීමත් සමග භික්ෂු සංඝයා අමතා පවසන්නේ ''ඇවැත්නි අපි අධර්මය බැබලවීමට පෙර, ධර්මය බැහැර වීමට පෙර අවිනය බැබලීමට පෙර, විනය බැහැර වීමට පෙර අධර්මවාදීන් බලවත් වීමට පෙර, ධර්මවාදීන් දුබලවීමට පෙර, අවිනයවාදීන් බලවත් වීමට පෙර විනයවාදීන් දුර්වල වීමට පෙර ධර්මය ද විනය ද සංගායනා කළ යුතුය''[4] යන්නයි. එහෙත් විනයට්ඨකථාවේ මෙම ප්‍රකාශය කිරීමට මත්තෙන් බුදුරජාණන් වහන්සේ ධරමානව වැඩ සිටි සමයේ කළ ප්‍රකාශයක් අන්තර්ගත කොට ඇත. ''ආනන්දය, මාවිසින් තොපට යම් ධර්මයක් හෝ විනයක් දේශනා කරන ලද්දේද? පනවන ලද්දේද? එය මාගේ අවෑමෙන් තොපගේ ශාස්තෘන් වන්නේය''[5] මෙකී දේශනාව බුදුරජුන් දේශනා කර

ඇත්තේ උන්වහන්සේගේ අවසන් බුද්ධ වචනය වන ''හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ''[6] යන වාක්‍යය දේශනා කිරීමට ප්‍රථමය.

මින්පසු ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා අවශ්‍ය කරන භික්ෂු සංඝයා එක්රැස් කිරීම ආරම්භ කරන ලදි. වාරතා දෙකෙහි ම සඳහන් වන අන්දමට පන්සියයට එකක් අඩු භික්ෂූන් වහන්සේලා රැස් කළහ. චුල්ලවග්ග පාළියට අනුව ආනන්ද හිමියන් ශෛක්ෂ්‍ය භික්ෂුවක් වුවත් ඡන්ද, දෝෂ, මෝහ ආදියෙන් යුක්ත වුවත් බුදුරජුන් සමීපයේ සිට බොහෝ ධර්මය විනය උගත් තෙර නමකි. ඒ නිසා අනික් භික්ෂූන් පවසන්නේ උන්වහන්සේ ද තෝරා ගතයුතුය යනුවෙනි. එහෙත් සමන්තපාසාදිකාව තුළ විස්තර වන්නේ මුලින් ආනන්ද හිමියන් ඒ සඳහා තෝරා නොගත් බවය. ඊට හේතු වශයෙන් දක්වන්නේ රහතුන් වහන්සේලා බොහෝ දෙනෙක් සිටිය දී ශෛක්ෂ්‍ය භික්ෂුවක් වූ ආනන්ද හිමියන් තෝරා ගත්තේ කුමක් නිසාදැයි අනිත් භික්ෂූන්ගේ චෝදනා කිරීම වැළැක්වීම සඳහාය. පසුව භික්ෂූන්ගේ ඉල්ලීම මත ආනන්ද හිමියන් ද තෝරා ගන්නා ලදි. ඉන්පසු සංගායනාව පැවැත්වීම සඳහා ස්ථානයක් සොයා ගැනීම, අජාසත් රජුගේ අනුග්‍රහය ලබා ගැනීම හා විහාරාරාම ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ තොරතුරු චුල්ලවග්ග පාළියේ කෙටියෙන් විස්තර වුවත් විනයට්ඨකථාවේ ඒ පිලිබඳ දීර්ඝ විස්තරයක් දැකිය හැකිය.

සංගායනාව පැවැත්වීමට කාලය පැමිණි පසු ඊට පෙර දින ආනන්ද හිමියන් සිතන්නේ තමා වැනි ශෛක්ෂ්‍ය භික්ෂුවක් සංගායනාවට යාම නුසුදුසු නිසා තමන් ද රහතන් වහන්සේ නමක් වහයෙන් ම එහි යා යුතු බවය. ඒ අනුව උන්වහන්සේ රාත්‍රියෙහි බොහෝ වේලාවක් කායගතාසති භාවනාවෙන් සිට රාත්‍රිය පහන් වනවිට නිදා ගන්නෙමියි සිතා කය ඒ දෙසට හැරවූයේය. හිස ද කොට්ටයට නොපැමිණියේය. පාද දෙක ද පොළොවෙන් එසවුණේය. මේ අතරෙහි සිත උපාදාන නොකොට ආශ්‍රවයන්ගෙන් මිදුණේය. සතර ඉරියව්වෙන් තොරව රහත් වූ බව වාර්තා දෙකෙහි ම විස්තර වුවත් සමන්තපාසාදිකාවේ එන විස්තරය මීට වෙනස්ය. එනම් අනෙකුත් රහතන් වහන්සේලා පැමිණ ආනන්ද හිමියන් වෙත පැමිණ පවසන්නේ '' ඇවැත්නි, හෙට දින ගස්වීම වන්නේය. ඔබ ද ශෛක්ෂ්‍යකි. කළයුතු කටයුතු ඇත්තේය.එහෙයින් එබට රැස්වීමට යාම සුදුසු නොවේ. අප්‍රමාදී වන්න.''[7] යනුවෙනි. මේ ප්‍රකාශය ඇසීමත් සමග උන්වහන්සේ මුලින් කී ආකාරයට බවුන් වඩා රහත් තත්වයට පත් වූහ. රහත් තත්වයට පත්ව උන්වහන්සේ සංගීතියට අනෙකුත් භික්ෂූන් සමග පිටත් වූ බව චුල්ලවග්ග පාළියේ සඳහන් වුවත් සමන්තපාසාදිකාවේ සඳහන් වන්නේ ආනන්ද හිමියන් අනෙකුත් භික්ෂූන් වහන්සේලා සන්නිපාත ශාලාවට ගොස් ආනන්ද හිමියන් කොහි දැයි විචාරන විට ඒ බව දැනගක් ආනන්ද හිමියන් තමන් සිටි ස්ථානයෙන් පොළොවට කිඳා බැස සන්නිපාත ශාලාවේ තමන්ට නියමිත ස්ථානයේ ප්‍රාතුර්භූත වූ බවය.[8]

සංඝායනාව ආරම්භයේ දි ම මහා කාශ්‍යප තෙරුන් විසින් උපාලි හිමියන්ගෙන් විනය පිළිබඳ තොරතුරු විමසා ඇත. සමන්තපාසාදිකාවේ දී කුමක් මුලින් සංගායනා කළයුතුදැයි විමසූ විට **''විනයො නාම බුද්ධසාසනස්ස ආයු''**[9] යනුවෙන් බුද්ධශාසනයේ ආයුෂය විනය මත පවතින නිසා ප්‍රථමයෙන් විනය සංගායනා කළයුතු බව දක්වයි. කාගෙන් විනය විචාරමු දැයි භික්ෂු සංඝයා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් උපාලි මහ රහතන් වහන්සේ සුදුසු බව පෙන්වා දෙයි. ආනන්ද හිමියන් ඊට නුසුදුසු දැයි මහා කාශ්‍යප හිමියන් පැවසූ අවස්ථාවේ භික්ෂූන් පෙන්වා දෙන්නේ බුදුන් ධරමාන සමයේ දී ම ''මේ උපාලි තෙමේ මාගේ විනයධර ශ්‍රාවකයන් අතරෙහි අග්‍රය'' යනුවෙන් එතදග්ග

පාළියේ[10] සඳහන් වීම නිසා ඊට සුදුසු බවය. ඒ අනුව මහා කාශ්‍යප හිමියන් උපාලි හිමියන්ගෙන් විනය පිළිබඳ විමසා ඇත. සමන්තපාසාදිකාව මෙම වාර්තාව චුල්ලවග්ග පාළියේ සඳහන් ආකාරයට ම විස්තර කර ඇත. එහි දී පෙන්වා දී ඇත්තේ ''තත්‍රායං පාළි'' යනුවෙන් දක්වා චුල්ලවග්ගපාළියේ සඳහන් පාඨය ඒ ආකාරයෙන් ම දක්වයි.[11] ඒ අනුව වාර්තා දෙකේ ම තොරතුරු කිසිදු වෙනසකින් තොරව ඉදිරිපත් කර ඇත.

චුල්ලවග්ග පාළියේ විනය පිළිබඳ විචාරීමේ දී භික්ෂූන් වහන්සේලාට බරපතල වූ පාරාජිකා හතර පිළිබඳ වෙන වෙනම විචාරා එම පාරාජිකා හතර දේශනා කළ ස්ථානය, දේශනා කළ පුද්ගලයා, කවර වස්තුවක් ද, නිදානය, ප්‍රඥප්ති, අනුප්‍රඥප්ති, ආපත්ති, අනාපත්ති ආදිය ද විමසා ඇත. මේ ආකාරයට ම උභතො විභංගය ම උපාලි හිමියන්ගෙන් විමසා ඇත. සමන්තපාසාදිකාවේ දක්වන්නේ පළමු පාරාජිකාවට අන්තර්ගත දේශනා කළ ස්ථානය, දේශනා කළ පුද්ගලයා, කවර වස්තුවක් ද, නිදානය, ප්‍රඥප්ති, අනුප්‍රඥප්ති, ආපත්ති, අනාපත්ති ආදිය පමණි. ඒ අනුව ම අනෙකුත් පාරාජිකාවල ද විස්තර විමසූ බව දක්වයි. මින්පසු විනය පිටකයට අයත් මහා විභංග හා භික්ඛුණී විභංගයට ඇතුළත් ඒ ඒ කොටස් වෙන වෙනම ගෙනහැර දක්වා ඇත. ඒ අනුව මහා විභංගයට අයත් අනෙකුත් කොටස් වන්නේ සංඝාදිසේස දහතුන, අනියත දෙක, නිසගිපචිති තිහ, පාචිත්තිය අනූ දෙක, පාටිදේසනීය හතර, සේඛියා හැත්තෑ පහ හා අධිකරණ සමථ හත යන 227 ක් වූ ශික්‍ෂා පද ද, භික්ඛුණී විභංගයට අයත් පාරාජිකා අට, එකසිය සංඝාදිසේස දහ හත, නිසගි පචිති තිහ, පචිති එකසිය හැට හය, පාටිදේසනීය අට, සේඛියා හැත්තෑ පහ, අධිකරණ සමථ හත යනුවෙන් 311 ක් වූ ශික්‍ෂා පද ද වෙන වෙන ම තැබූ බව සඳහන් වේ.[12]

විනය සංඝායනාවෙන් පසුව ධර්මය සංගායනා කිරීම සඳහා ආනන්ද තෙරුන්ගෙන් කරුණු විමසූ ආකාරය වාර්තා දෙකේ ම සඳහන් වේ. ඒ සඳහා ආනන්ද තෙරුන් සුදුසු බව භික්ෂූන් විසින් ප්‍රකාශ කිරීම සමන්තපාසාදිකාවේ පමණක් දක්නට ලැබේ. ප්‍රථමයෙන් බ්‍රහ්මජාල සූත්‍රය දේශනා කළේ කොහේදී ද?, දේශනා කළේ කාට ද?, එහි නිදානය, පුද්ගලයා යන තොරතුරු විමසා ඇත. අනතුරුව සාමඤ්ඤඵල සූත්‍රයේ එකී කරුණු ම විමසා ඇති අතර ඉන්පසු නිකාය පහ ම පිළිවෙලින් විමසූ බව ''එතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි''[13] යන පාඨයෙන් අවසන් කර ඇත.

චුල්ලවග්ගපාළියේ එන තොරතුරට අනුව ධර්මය හා විනය සංගායනාව අවසානයේ බුද්දානුබුද්දක ශික්‍ෂා පද වශයෙන් කොටසක් ඇති බව භික්ෂූන් වහන්සේලා පිළිගත්හ. බුද්දානුබුද්දක ශික්‍ෂාපදවලට අයත් වන්නේ සතර පාරාජිකා, සංඝාදිසේස දහතුන, අනියත දෙක, නිසගි පචිති තිහ, පචිති අනූ දෙක හැර අනිත් සියල්ල යැයි ඇතැම් තෙර කෙනෙක් කීහ. ඇතමුන්ගේ මතය වූයේ සතර පාරාජිකා, සංඝාදිසේස දහතුන, අනියත දෙක, නිසගි පචිති තිහ, පචිති අනූ දෙක පාටිදේසනිය හතර මීට අයත් වන බවය. එහිදී මහ කාශ්‍යප මහරහතන් වහන්සේ පැවසූයේ ''භික්ෂූන් වහන්සේලාට ගිහියන් පිළිබඳ වූ ශික්‍ෂා පද ඇත්තේය. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට මෙය කැපය. මෙය අකැපය යන්න ගිහියෝ ද දනිති. ශ්‍රමණ ගෞතමයන් අපට නීති පැනවූයේ උන්වහන්සේගේ පිරිනිවීම තෙක් පමණි. එමනිසා මින් ඉදිරියට උන්වහන්සේ වැඩසිටි සමයේ යම් ශික්‍ෂා පදයක් පනවන ලද්දේ නම් ඒ සියල්ල නොපිරිහෙළා පිළිපැදිය යුතුය. නොපැනවූ දෙයක් නොපැනවීමටත් පැන වූ දෙයක් නොසිඳීමටත් කටයුතු කළයුතුය''[14] යන්න පෙන්වා දී ඇත. මෙය ප්‍රථම සංඝායනාවේදී භික්ෂූන්

වහන්සේලා මුහුණ දුන් ගැටළුවකි. එනම් බුද්දානුබුද්දක ශික්‍ෂාපද මොනවාද යන්න තේරුම් කර ගැනීම අපහසු වීමයි.

චුල්ලවග්ග පාළියේ එන විස්තරයට අනුව මේ පිළිබඳ තවදුරටත් කරුණු විමසිය යුතු වන්නේ නම් මහා කාශ්‍යප හිමියන් විසින් ඒ සඳහා අවසරාව ලබා දී ඇත. ඒ අනුව බුද්දානුබුද්දක ශික්‍ෂාපද පිළිබඳ ගැළුව හා තවත් කරුණු කිහිපයක් යටතේ ආනන්ද හිමියන්ට චෝදනා කිරීම පිළිබඳ පුවත මින් පසුව එයි. එම චෝදනා අනුපිලිවෙලින් මෙසේ දැක්විය හැකිය.

භික්‍ෂූහු :- ඇවැත් ආනන්දය, බුද්දනුබුද්දක ශික්‍ෂා පද බුදුරජුන්ගෙන් නොවිමසුවේ කුමක් නිසා ද?

ආනන්ද හිමි :- වහන්ස, මම නොසිහියෙන් සිටියෙමි. එය වරදක් යැයි නොසිතමි. එහෙත් ආයුෂ්මතුන් වහන්සේ වරදක් යැයි කියන්නේ නම් එය පිළිගනිමි.

භික්‍ෂූහු :- ඇවැත් ආනන්දය, තෙපි භාග්‍යවතුන් වහන්සේගේ වැසි සළුව පයින් මැඩගෙන මැසීම වරදකි. එසේ කළේ කුමක් නිසාද?

ආනන්ද හිමි :- වහන්ස, මම අගෞරවකින් එසේ නොකළෙමි. එය වරදක් නම් පිළිගනිමි.

භික්‍ෂූහු :- ඇවැත් ආනන්දය, පිරිනිවන් පෑ බුදුරජුන්ගේ ශ්‍රී දේහය මාගමුන් ලවා මුලින් වැන්දවූයේ කුමක් නිසාද?

ආනන්ද හිමි :- වහන්ස, ''මොවුහු විකාලයෙහි හැසිරෙන්නෝ නොවත්වා''යි සිතා එසේ කළෙමි.

භික්‍ෂූහු :- ඇවැත් ආනන්දය, බුදුන් සතර ඍද්ධිපාද වැඩූ පුද්ගලයෙකුට කල්පයක් වුවත් සිටින්නට හැකි යැයි දෙසූ අවස්ථාවේ ඊට ප්‍රතිචාර වශයෙන් උන්වහන්සේට කල්පයක් වැඩ සිටීමට ආරාධනා නොකළේ කුමක් නිසාද?

ආනන්ද හිමි :- වහන්ස, ඒ අවස්ථාවේ මාරයා විසින් මා මඩනා ලදුව සිටි නිසා එසේ කිරීමට නොහැකි වුණි.

භික්‍ෂූහු :- ඇවැත් ආනන්දය, බුදුරජුන් කිහිප විටක් ම ප්‍රතික්‍ෂ්ප කරද්දීත්, තෙපි මාගමුන් කෙරෙහි පැවිද්ද ලබා දීමට බුදුරජුන් උත්සහවත් කළාහුය. එසේ කළේ කුමක් නිසාද?

ආනන්ද හිමි :- වහන්ස, මහා ප්‍රජාපතී ගෝතමිය භාග්‍යවතුන් වහන්සේගේ මවගේ සහෝදරියයි. උන්වහන්සේ හදාවඩා ගන්නා ලද්දීය. පෝෂණය කළාය. කිරි දුන්නීය. මව කළුරිය කළ විට මව් කිරි දුන්නේ ඇයයි. එහෙයින් ඇය කෙරෙහි අනුකම්පාවෙන් එසේ කළෙමි.[15]

මේ සියලු චෝදනා ඉදිරිපත් කළ විට ආනන්ද හිමියන් පවසන්නේ තමා විසින් වරදක් නොකරන ලද බවය. එහෙත් සියලු සංඝයා එය වරදක් යැයි හඟින්නේ නම් එය පිළිගැනීමට සූදානම් බව ආනන්ද හිමියන් පවසා ඇත. මින් පසු වාර්තා වන්නේ ඡන්න භික්‍ෂුවට බ්‍රහ්මදණ්ඩනය

දුන් කතා පුවතයි. බුදුන් ධරමාන සමයේ දී ම ඡන්න භික්ෂුව හික්මුණු නොවුන නිසා බුදුරජුන් ආනන්ද හිමියන්ට පවසා ඇත්තේ තමන්ගෙන් පසුව ඡන්න භික්ෂුව හික්ම නොවුණහොත් බ්‍රහ්මදණ්ඩනය පැනවිය යුතු බවය. ඒ අනුව සියලු භික්ෂූන්ගේ ඒකමතිකත්වයෙන් උන්වහන්සේට එකී දඬුවම නියම කෙරිණ. මෙතෙකින් චුල්ලවග්ග පාළියේ සංගායනා වාර්තාව අවසන් වේ. ඉන්පසු සංගායනාවට පෙර පන්සියයක් භික්ෂූන් සමග දක්ඛිණාගිරියට ගිය පුණ්ණ තෙරුන් වස් කාලය නිමවීමෙන් පසු නැවත රජගහ නුවරට වැඩි අවස්ථාවේ සංගායනාව සිදු කළ බවත් එය පිළිගන්නා ලෙසත් කියා සිටියේය. එහෙත් උන්වහන්සේගේ පිළිතුර වූයේ තමන් බුදුරජුන් විසින් දේශනා කළ සියලු දේ දන්නා බවත් ඒ අනුව කටයුතු කරන බවත්ය.[16]

මෙතෙකින් චුල්ලවගග්ග පාළියේ සංගායනා වාර්තාව අවසන් කරයි. මින්පසු පඤ්චසතිකක්ඛන්ධකය අවසන් වනතුරු විස්තර කරන්නේ ආනන්ද හිමියන් විසින් උදේන රජුට කළ ධර්ම දේශනාව පිළිබඳ තොරතුරුය. එහෙත් සමන්තපාසාදිකාව මුලින් කී ''එතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි'' යනුවෙන් කළ ප්‍රකාශයේ පටන් ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් සපයයි. සමන්තපාසාදිකාවේ බුද්දානුබුද්දක ශික්ෂා පද පිළිබඳ ව හෝ ආනන්ද හිමියන්ට කළ චෝදනා පිළිබඳ හෝ බ්‍රහ්මදණ්ඩන කථා පුවත පිළිබඳ ව හෝ විස්තරයක් ඇතුළත් කර නොමැත. සමන්තපාසාදිකාව හා චුල්ලවග්ග පාළිය අතර ගැටුම ඇතිවන්නේ මෙයින් පසුවය. චුල්ලවග්ග පාළියේ පඤ්ච නිකායක් සංගායනා කළ බව සඳහන් වුවත් සමන්තාපාසාදිකා අටුවාකරු පඤ්ච නිකාය පිළිබඳ තොරතුරු දැක්වුවත් ඉන්පසු ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් සපයයි. එහිදී බුද්ධවචනය විවිධ කොටස්වලට බෙදා දක්වයි.

''ඒ සියලු බුද්ධවචනය රස වශයෙන් ඒකවිධය. ධම්ම හා විනය වශයෙන් දෙවැදෑරුම්ය. පඨම, මජ්ඣිම හා පශ්චිම වශයෙන් තෙවැදෑරුම්ය. පිටක වශයෙන් ද එසේම ය. නිකාය වශයෙන් පසු වැදෑරුම්ය. අංග වශයෙන් නවවිධය. ධර්මස්ඛන්ධ වශයෙන් අසූහාර දහසකි.''[17] බුද්ධඝෝෂ හිමියන් දක්වන සාම්ප්‍රදායික මතය හා චුල්ලවග්ගපාළියෙ සඳහන් වාරතාවත් අතර ගැටීමක් දැකිය හැකිය. ''නිකාය වශයෙන් පස්වැදෑරුම්ය'' යන්න හා ''පිටක වශයෙන් තුන් වැදෑරුම් ය'' යන්න පිළිබඳ ගැටළු මතුකරයි. මෙහි නිකාය පහට අයත් වන්නේ දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර හා ඛුද්දක නිකායයි. පිටක වශයෙන් දක්වන තැන උන්වහන්සේ පෙන්වා දෙන්නේ විනය, සූත්‍ර හා අභධර්ම යන පිටක ග්‍රන්ථයි. ඛුද්දක නිකාය එක් තැනක හඳුන්වා ඇත්තේ පණ්ණරස (15) භේද වන බවය. එහෙත් එහි ම තවත් තැනක ඛුද්දක නිකාය යනු කුමක්දැයි විස්තර කර ඇත්තේ මෙසේය.

''ඛුද්දක නිකාය නම් කවරේද යත්? සිවු නිකාය හැර සියලු විනය පිටකය හා අභිධර්ම පිටකය, පෙර සූත්‍ර පිටක හැඳින්වීමේදී දක්වන ලද පසළොස් ප්‍රභේද වූ ඛුද්දක පාඨාදීන් හා සෙසු බුද්ධවචනයයි.''[18]

මෙකී ප්‍රකාශයට අනුව ඛුද්දක නිකාය පර්යාපන්න කෘති ලෙස විනය පිටකයේ ග්‍රන්ථ පහ, අභිධර්ම පිටකයේ ග්‍රන්ථ හත හා ඛුද්දක නිකායේ ග්‍රන්ථ පහළොව එකතුකළ විට ඛුද්දක නිකායාගත කෘති විසි හතක් ඇති බව පිළිගැනීමට සිදු වේ. මෙවැනි අදහසකට තුඩුදෙන කිසිවක් චුල්ලවග්ගපාළියේ සඳහන් නොවේ. එසේ ම මේ ප්‍රකාශයට අනුව පට්ඨාන ප්‍රකරණය ආදි විශාල ග්‍රන්ථ ද ඇතුළත් වේ. එසේ වී නම් මෙයට ඛුද්දක යන නම භාවිතා කළේ කුමක් නිසාද? යන්න

ගැටළුවකි. මෙහි ඇතුළත් ප්‍රථම කෘතිය වන ඛුද්දක පාඨය පසුකාලීන යැයි බොහෝ විද්වතුන්ගේ මතයයි. එය සාමාන්‍යයෙන් ක්‍රි. ව. 5 වෙනි ශතවර්ෂයේ දි පමණ සම්පාදිත වූ බව සඳහන් වේ. එපමණක් නොව ථෙරගාථා පාළියේ ක්‍රි. පූ. 3 ව නසියවසේ විසූ අශෝක අධිරාජයාගේ සහෝදරයෙකුගේ ගාථා ද වෙයි. බුද්ධවංසය ද පසුකාලීන කෘතියක් බව දැක්වේ. සුත්ත නිපාතයේ අට්ඨක හා පාරායන වග්ග දෙකේ එන සූත්‍ර පැරණි බුද්ධ දේශනාය.[19] ඒ අනුව ඛුද්දක නිකාය ශතවර්ෂ 10 ක පමණ කාලයක සිට සංවර්ධනය වෙමින් පැවත ආ කෘතියක් බව කිවහැකිය.

විනය පිටකයට අන්තර්ගත අවසන් කෘතිය වන පරිවාර පාළියේ සඳහන් තොරතුරුවලට අනුව එය ක්‍රිස්තුවර්ෂාරම්භයට ආසන්න කාලයක විසූ දීප නැමති තෙරුන් විසින් ශිෂ්‍යයින්ගේ ප්‍රයෝජනය සඳහා ලියන ලද්දකි. එවැනි ග්‍රන්ථයක් ප්‍රථම සංගීතියේ ඛුද්දක නිකායේ තිබුණේ යැයි තර්ක කළ නොහැකිය.

බුද්ධඝෝෂ හිමියන් ම දක්වන අන්දමට අභිධර්ම පිටකයේ කථාවත්ථුප්පකරණය සම්පූර්ණත්වයට පත් වූයේ තුන්වන ධර්ම සංගායනාවේදීය.[20] එසේ වීනම් අභිධර්ම පිටකය පළමු ධර්ම සංගායනාවේදී සංගායනා වූ බව පිළිගත නොහැකි කරුණකි. චුල්ලවග්ග පාළියේ අභිධර්ම පිටකයක් සංගායනා වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. එහි සඳහන් වන්නේ ''ධම්මං ච විනයං ච සංගායෙය්‍යාම'' යනුවෙනි. මේ පාඨය ම සමන්තපාසාදිකවේ ද දැක්වේ. ඒ අනුව අභිධර්ම පිටකය පළමු සංගායනාවේදී සංගායනා වූ බව සමන්තපාසාදිකවේ සඳහන් වීම ගැටළු සහගතය. ඒ අනුව බුද්ධ වචනය බෙදා දැක් වූ අයුරු පිළිගත නොහැකිය. එසේම චුල්ලවග්ග පාළියේ පංචසතිකක්ඛන්ධකය හා සත්තසතිකක්ඛන්ධකය යනුවෙන් ඛන්ධක දෙකක් හමු වේ. මෙයින් දෙවෙනි ඛන්ධකයේ විස්තර වන්නේ දෙවෙනි ධර්ම සංගායනාව පිළිබඳ වය. දෙවෙනි ධර්ම සංගායනාව පැවැත්වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ සියයක් ගිය තැනේදී ය. ඒ අනුව මෙය චුල්ලවග්ග පාළියට ඇතුළත් කර ඇත්තේ දෙවෙනි ධර්ම සංගායනාවෙන් පසුවය. එයින් ගම්‍ය වන්නේ චුල්ලවග්ග පාළිය ද ප්‍රථම සංගායනාවේ දී සම්පූර්ණත්වයට පත් නොවූ බවය. බුද්ධඝෝෂ හිමියන්ගේ වාර්ථාව හා චුල්ලවග්ග පාළි වාර්ථාව අතර ගැටීමක් ඇතිවන බව මෙයින් පෙන්වා දිය හැකිය.

ආන්තික සටහන්

---

1 ''අලං ආවුසො මා සොචිත්ථ. මා පරිදෙවිත්ථ. සුමුත්තා මයං තෙන මහා සමණෙන. උපද්දුතා ච මයං හෝම, ඉදං වොකප්පති, ඉදං වො න කප්පතී'ති. ඉදානි පන මයං ඉච්ඡිස්සාම තං කරිස්සාම, යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාමාති''

චුල්ලවග්ග පාළි, පඤ්චසතිකක්ඛන්ධකය, බු. ජ. මු. 1983, පි. 544.

2 දීඝනිකාය, මහාවග්ග, මහාපරිනිබ්බාන සුත්තං, බු. ජ. මු. නව මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005, පි. 256.

3 සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 03.

4 ''හන්ද මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සංගායාම. පුරෙ අධම්මො දිප්පති, ධම්මො පටිබාහීයති. පුරෙ අවිනයො දිප්පති, විනයො පටිබාහීයති. පුරෙ අධම්මවාදිනො බලවන්තො හොන්ති, ධම්මවාදිනො දුබ්බලා හොන්ති. පුරෙ අවිනයවාදිනො බලවන්තො හොන්ති විනයවාදිනො දුබ්බලා හොන්තී''ති''

චුල්ලවග්ග පාළි, පඤ්චසතිකක්ඛන්ධකය, බු. ජ. මු. 1983, පි. 546.

5 ''යො වො ආනන්ද, මයා ධම්මෝ ච විනයෝ ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා''

සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 03.

[6] දීඝනිකාය, මහාවග්ග, මහාපරිනිබ්බාන සුත්තං, ----

[7] ''ස්වේ ආවුසො සන්නිපාතො, ත්වං ච සෙක්ඛො සකරණියො, තෙන තෙ න යුත්තං සන්නිපාතං ගන්තුං. අප්පමත්තෝ හොහි'ති''

සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 07.

[8] -එම- පි. 07.

[9] -එම- පි. 07.

[10] ''එතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං විනයධරානං යදිදං උපාලී'ති''

අංගුත්තර නිකාය, එතදග්ග වග්ග, උපාලි වත්ථු

[11] ''සුණාතු මෙ ආවුසො සංඝො. යදි සංඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං උපාලි විනයං පුච්ඡෙය්‍යන්ති. ආයස්මාපි උපාලි සංඝං ඤාපෙසි. සුණාතු මෙ භන්තේ සංඝො. යදි සංඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විසජ්ජෙය්‍යන්ති''

චුල්ලවග්ග පාළි, පඤ්චසතිකක්ඛන්ධකය, බු. ජ. මු. 1983, පි. 548.

සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 08.

[12] සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 08.

[13] චුල්ලවග්ග පාළි, පඤ්චසතිකක්ඛන්ධකය, බු. ජ. මු. 1983, පි. 550.
සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 09.

[14] චුල්ලවග්ග පාළි, පඤ්චසතිකක්ඛන්ධකය, බු. ජ. මු. 1983, පි. 552.

[15] -එම- පි. 554-556.

[16] -එම- පි. 556.

[17] ''තදෙතං සබ්බම්පි බුද්ධවචනං රසවසෙන එකවිධං, ධම්ම විනය වසෙන දුවිධං, පඨමමජ්ඣිමපච්ඡිම වසෙන තිවිධං, තථා පිටක වසෙන, නිකාය වසෙන පඤ්චවිධං, අංගවසෙන නවවිධං, ධම්මක්ඛන්ධ වසෙන චතුරාසීති සහස්සවිධනංති වෙදිතබ්බං'' සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 09.

[18] ''කතමො ඛුද්දක නිකායෝ? සකලං විනය පිටකං අභිධම්මපිටකං ඛුද්දකපාඨාදයො ච පුබ්බේ නිදස්සිතා පඤ්චදස භේදා ඨපෙත්වා චත්තාරො නිකායෙ අවසෙසං බුද්ධවචනන්ති''

සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 15.

[19] චන්ද්‍රා වික්‍රම ගමගේ, ''ප්‍රථම සංගීතයේ සාහිත්‍ය පිළිබඳ බුද්ධඝෝෂ හිමියන් ඉදිරිපත් කරන සාම්ප්‍රදායික මතය හා චුල්ලවග්ග පාළියේ එන වාර්තාව අතර ගැටීම'' ශාස්ත්‍රීය ලිපියකි. ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 2000, පි. 165.

[20] සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු. නවමුද්‍රණය, 1985, පි. 35.